දැන්වීමයි

2022 වර්ෂය සඳහා නොතාරිස් බලපත්‍ර අලුත් කිරීමට අදාලව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සැලකිලිමත් වන්න.

1. නොතාරිස් බලපත්‍රය අලුත් කිරීම 2022.01.03 සිට 2022.02.28 දක්වා පමණි.

2. යම් නොවැලක්වීය හැකි හේතුවක් මත ඉහත සඳහන් කල දිනයන්හි දී බලපත්‍රය අලුත් කිරීම සිදු කිරීමට නොහැකි වුවහොත් ඊට හේතු දක්වා දිවුරුම් ප්‍රකාශයක් ලබා දීම අනිවාර්ය වේ.

3. නොතාරිස් බලපත්‍රය අලුත් කිරීමේ ගාස්තුව රු.3000/- ක් වේ. (රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ RG/NB/01/වක්‍ර ලේඛ අනුව)

4. නොතාරිස් බලපත්‍රය අලුත් කිරීමට අදාල ලේඛන
   - නොතාරිස් ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය
   - ප්‍රකාශයේ (Declaration) මුල් පිටපත සමඟ ඡායා පිටපතක්
   - රක්ෂණ බලපත්‍රය අලුත් කිරීමේ කුවිතාන්සිය
   - රු.65/- මුද්දර ඇලවූ 9" 4" ප්‍රමාණයේ ලිපිනය ලියන ලද ලියුම් කවරයක්

5. පෙර වර්ෂයට බලපත්‍ර අලුත් කිරීම සිදු නොකර මෙම වර්ෂයට බලපත්‍ර අලුත් කරන්නේ නම් දිවුරුම් ප්‍රකාශයක් සමඟ අදාල ලේඛන භාර දිය යුතු වේ.

6. බලපත්‍ර අලුත් කිරීමේදී රක්ෂණ බලපත්‍රය අලුත් කර අදාල රිසිට් පත ඇගෙන ඒම අවශ්‍ය වේ.

ඔබගේ අවධානය සඳහා

- මහාධිකරණ ලිපි ගොනු අංකය ප්‍රකාශයේ (Declaration) නිවැරදිව දැක්වීමට කාරුණික වන්න.
- ලියුම් කවරය භාර දීමේදී ඔබ විසින් ඉහත සඳහන් ප්‍රමාණයේ ලියුම් කවරයක් අප වෙත භාර දීමට කාරුණික වන්න. විශාල ප්‍රමාණයේ ලියුම් කවර භාර නොගන්නා අතර ඒ පිළිබඳ වඩාත් සැලකිලිමත් වන්න.
- දැනට පවතින වසංගත තත්ත්වය මත ඔබ සියළු දෙනා අවසන් දින තෙක් නොසිට හැකි පළමු අවස්ථාවේදීම බලපත්‍රය අලුත් කිරීමට අදාලව පියවර ගන්න.
- ඔබ භාර දෙන ප්‍රකාශයේ (Declaration) ඔබ විසින් භාවිතා කරන දුරකථන අංක 02 ක් සඳහන් කරන්න

අතිරේක නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් (නොතාරිස් අංශය)
අතිරේක නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
නොතාරිස් අංශය
කොළඹ 12.

2021.12.07 වන දින.